සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2026
තෙවන වාර පරීක්ෂණය

විෂයය නම (ගිණුම්කරණය) பாடத்தின் பெயர் (கணக்கியல்) Subject Name (Accounting)	32	S	I	13 ශ්‍රේණිය 13-ஆம் வகுப்பு Grade 13

පැය තුනයි மூன்று மணிநேரம். Three Hours	අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි. கூடுதல் வாசிப்பு நேரம் - 10 நிமிடங்கள். Additional Reading Time – 10 minutes

උපදෙස් :

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.**
- **අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාල තිත් ඉරිමත ලියන්න.**

(1) පහත දැක්වෙන කුමන ප්‍රකාශය මඟින් ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණු වඩාත් හොඳින් විස්තර කරනු ලබයිද?

1. ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම.
2. ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා කළමනාකරණ තොරතුරු සැපයීම.
3. ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු සැපයීම.
4. ආයතන ගණුදෙනු මූලික පොත්වල සටහන් කිරීම.
5. ආයතනයක අභ්‍යන්තර පාර්ශ්වයන්ගේ ප්‍රයෝජනය සඳහා විශේෂ පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම.

(.....)

(2) 2010 වර්ෂයේදී රු. 2000000 කට මිලදීගත් ඉඩමක් 2026.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 5,000,000ක් වූ ප්‍රත්‍යාගණන වටිනාකමට වාර්තා කර ඇත. මෙම අවස්ථාවේදී අනුගමනය කර නොමැති ගිණුම්කරණ සංකල්පය හා ප්‍රත්‍යාගණන වටිනාකම වාර්තා කිරීමෙන් පිළිඹිබු වන ගුණාත්මක ලක්ෂණය කුමක්ද?

	සංකල්පය	ගුණාත්මක ලක්ෂණය
1.	ඒකක	අදාළ බව
2.	ගැලපුම්	විශ්වාසනීය නියෝජනය
3.	ඓතිහාසික පිරිවැය	අවබෝධ කරගත හැකි බව
4.	ඓතිහාසික පිරිවැය	සංසන්දනාත්මක බව
5.	ඓතිහාසික පිරිවැය	අදාළ බව

(.....)

Past Papers Wiki

(3) රු. 20,000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් පිරිවැයට 25% ක ලාභයක් සහිතව විකිණීමේ හෝ ආපසු එවීමේ පදනමට යවන ලදී. ඉන් භාණ්ඩ විකුණුම් රු. 20,000 කි. විකිණීමේ හෝ ආපසු එවීමේ කාලය තවම අවසන් නැත. ඉතිරි තොගයේ වටිනාකම කොපමණද?

1. ඉතිරි තොගයක් නැත
2. රු. 5000
3. රු. 6250
4. රු. 4000
5. රු. 4500

(.....)

(4) පුබුදු සමාගම විසින් 2026/01/01 දින සුමුදු සමාගමට රු. 75,000ක් වටිනා භාණ්ඩ ණයට විකුණන ලදී. රු. 2000ක් වටිනා භාණ්ඩ ප්‍රවාහනයේදී පළුදු වී ඇති බැවින් 2026/01/04 දින ආපසු එවන ලදී. සුමුදු සමාගම රු. 30,000ක මුදලක් චෙක්පතකින් ගෙවන ලදී.

ඉහත ගනුදෙනු සඳහා පුබුදු සමාගම විසින් භාවිතා කළ යුතු මූලාශ්‍ර ලේඛන පිළිවෙළින් දක්වා ඇති පිළිතුර කුමක්ද?

1. හරපත, ඉන්වොයිසිය, වවුචරය
2. ඉන්වොයිසිය, බැරපත, ලදුපත
3. බැරපත, ලදුපත, ඉන්වොයිසිය
4. ඉන්වොයිසිය, හරපත, බැංකු විස්තරය
5. ඉන්වොයිසිය, බැරපත, වවුචරය

(.....)

(5) සමගි ව්‍යාපාරයේ 2026/6/30 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර වෙනස අවිනිශ්චිත ගිණුමකට ඇතුළත් කර කාලච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන ලදී. ඒ අනුව කාලච්ඡේදයේ ලාභය රු. 33,000 ක් විය. පසුව කළ සොයා බැලීමේදී පහත වැරදි අනාවරණය විය.

A) රු. 5500 ක අත්පිට ගැණුම් ණයට ගැණුම් ලෙස පිටපත් කර ඇත.

B) රු. 1500 ක ආපසු එවුම්, ආපසු යැවුම් ලෙස සලකා ආපසු යැවුම් ගිණුම බැර කළ ද පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර ඇත.

C) රු. 15,000 ණයගැති ලැබීම් වැරදීමකින් ණයහිමි ගෙවීමක් ලෙස මුදල් ගෙවීම් ජ'නලයේ ණයහිමි ගෙවීම් විශ්ලේෂණ තීරුවේ දක්වා ඇති අතර මේ පිළිබඳව වෙනත් සටහනක් කර නැත.

D) ගෙවිය යුතු විදුලි ගාස්තු රු. 1500 පිළිබඳව කිසිදු සටහනක් කර නැත.

ඉහත වැරදිවලින් අවිනිශ්චිත ගිණුමක් ඇතිවන්නේ,

1. A හා B මඟිනි
2. B හා C මඟිනි
3. C හා D මඟිනි
4. A හා D මඟිනි
5. B හා D මඟිනි

(.....)

(6) ව්‍යාපාරයක 2026.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කල යුතු ශේෂය රු. 80,000කි. එදිනට ණයගැති ලෙජරයේ ශේෂ එකතුව මීට වඩා වෙනස් වූ අතර එම වෙනසට පහත හේතු බලපා ඇත.

1. විකුණුම් ජර්නලයේ එකතුව රු 2,000කින් අඩු වී ඇත.
2. ණයට විකුණුම් රු 20,000ක් විකුණුම් ජර්නලයේ සටහන් වී ඇත්තේ රු 2000ක් ලෙසය.
3. රු 4,500ක ණයට විකුණුම් අදාළ ණයගැති ගිණුමට පිටපත් කර ඇත්තේ රු 5,400ක් ලෙසය.
4. දුන් වට්ටම් රු 500ක් ණයගැති ලෙජරයේ පෞද්ගලික ගිණුමේ සටහන් කර නොමැත.

2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කළ යුතු ණයගැති ශේෂය වනුයේ,

1. රු 79,100කි.
2. රු 88,600කි.
3. රු 98,000කි.
4. රු 98,600කි.
5. රු 100,000කි.

(.....)

- **ප්‍රශ්න අංක 7 හා 8 සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

ලියෝ බ්‍රදර්ස් ආයතනයේ 2026 මාර්තු 31 අවසන් වර්ෂයට අදාළ පහත තොරතුරු දී ඇත.

	රු (000)
විකුණුම්	1200
විකුණුම් පිරිවැය	600
බෙදාහැරීමේ වියදම්	120
පරිපාලන වියදම්	120

❖ අමතර තොරතුරු

- කාලච්ඡේදය තුළ ව්‍යාපාරය විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත විකිණීමට භාරදෙන ලද තොග විකුණුම් ලෙස ගිණුම්ගත කර ඇත. මින් විකුණුම් මිල 30,000 (පිරිවැය 20,000) තොගයක් තවම විකිණී නැත.
- ණයගැතියන්ගෙන් 10% හානිකරණ අලාභ ලෙස වෙන්කෙරේ.

(7) අදාළ ගැලපීම් සිදුකළ පසු 2026.03.31 දිනට විකුණුම් පිරිවැය හා බෙදාහැරීමේ වියදම් වල වටිනාකම වන්නේ,

	විකුණුම් පිරිවැය	**බෙදාහැරීම් වියදම්**
1.	565	135
2.	585	117
3.	565	118
4.	580	117
5.	585	130

(.....)

(8) අදාළ ගැලපීම් සිදුකළ පසු ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,

1. රු. 353,000
2. රු. 330,000
3. රු. 319,000
4. රු. 318,000
5. රු. 340,000

(.....)

(9) සරණ අවමංගල්‍යාධාර සමිතියේ 2026/03/31 න් අවසන් වර්ෂයට පහත ශේෂ දැකිය හැකි විය.

	2026/03/31 දිනට (රු.000)	(2025)/04/11 දිනට (රු.000)
ලැබිය යුතු හිඟ සාමාජික මුදල්	100	50
ඉදිරියට ලද සාමාජික මුදල්	70	60
යාවජීව සාමාජික මුදල්	120	100

අතිරේක තොරතුරු

- කාලච්ඡේදයේ මුදලින් සාමාජික මුදල් ලෙස රු. 500,000 ක මුදල් ලැබුණු අතට යාවජීව සාමාජික මුදල් ලෙස මුදලින් රු.120,000 ක් ලැබුණි. යාවජීව සාමාජික මුදලින් කාලච්ඡේදයට අදාළව රු.40,000 ක් ආදායම් ලෙස හඳුනාගත යුතුව පවතී. ඉහත තොරතුරු අනුව වර්ෂයට අදාළ සාමාජික මුදල් ආදායම වනුයේ,

1. රු. 600,000
2. රු. 590,000
3. රු. 620,000
4. රු. 550,000
5. රු.580,000

(.....)

- **රම්‍යා හා සුරම්‍යා 7 : 3 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට $\frac{1}{4}$ ක ලාභ කොටසකට සුභා බඳවා ගන්නා ලදී. සුභා බඳවා ගන්නා අවස්ථාවේ ව්‍යාපාරයේ කීර්ති නාමයේ අගය රු. 400,000 කට අගය කරන ලදී. 10,11 ප්‍රශ්න සඳහා මෙම තොරතුරු සැලකිල්ලට ගන්න.**

(10) රම්‍යා, සුරම්‍යා හා සුභා හවුල් ව්‍යාපාරයේ නව ලාභාලාභ අනුපාත වන්නේ,

පිළිතුරු අංක	1.	2.	3.	4.	5.
රම්‍යා	18	15	20	21	28
සුරම්‍යා	12	15	10	9	2
සුභා	10	10	10	10	10

(.....)

(11) නව අනුපාත අනුව රම්‍යා, සුරම්‍යා, සුභා අතර ප්‍රාග්ධන ගිණුම් වලට හරවිය යුතු කීර්ති නාම අගයන් වන්නේ,

රු (000)

පිළිතුරු අංක	1.	2.	3.	4.	5.
රම්‍යා	200	210	180	250	280
සුරම්‍යා	100	90	120	50	20
සුභා	100	100	100	100	100

(.....)

(12) සඳරුගේ ව්‍යාපාරයේ 2026 ජනවාරි මස සිදු වූ ගනුදෙනු සහ අතිරේක තොරතුරු පහත දැක්වේ.

- භාණ්ඩ ණයට ගැනුම් රු 20,000 ක් වන අතර මාසය තුළ මේවායින් පිරිවැය රු 15,000 ක් වූ භාණ්ඩ ණයට විකුණා ඇත.
- බොල් ණය කපා හැරීම රු 3000 කි. පසුගිය වර්ෂයේ කපා හරින ලද රු 1000 ක බොල් ණයක් ජනවාරි මාසය තුළදී ආපසු ලැබී ඇත.
- ජනවාරි මාසය සඳහා විදුලි බිල්පත රු 5000කි. එය ගෙවන ලද්දේ 2026 පෙබරවාරි 10 වන දිනදීය.
- 2026 ජනවාරි මාසයට අදාළ වේතන රු. 10,000 ක් එම මාසය තුළ ගෙවා නොමැති අතර 2025 දෙසැම්බර් මාසයට අදාල වේතන රු 8,000 ක් ගෙවා ඇත.

ඉහත ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසය සඳහා ආදායමට එරෙහිව ගැලපිය යුතු මුළු වියදම කොපමණද?

1. රු. 24,000
2. රු. 25,000
3. රු. 32,000
4. රු. 36,000
5. රු. 41,000

(.....)

(13) නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වා නොගන්නා ව්‍යාපාරයක 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අනාවරණය කරගෙන ඇත.

		රු.
විකුණුම්		500,000
ගැණුම්		400,000
ගැනිලි -	මුදල්	30,00
-	භාණ්ඩ	70,000
2026.03.31	තොගය	80,000

- දළ ලාභ අනුපාතය 40% කි.

2025.04.01 දින තොග වටිනාකම වන්නේ,

1. රු. 20,000 කි.
2. රු. 50,000 කි.
3. රු. 80,000 කි.
4. රු. 90,000 කි.
5. රු. 120,000 කි.

(.....)

- **14, 15 ප්‍රශ්න සඳහා රත්න සමාගමේ තොග පිළිබඳ විස්තර පහත දැක්වේ. (කාලච්ඡේදය 2026/03/31 දිනෙන් අවසන් වේ)**

නිෂ්පාදනය	වර්ගය	ඒකක ගණන	ඒකක පිරිවැය	ඒකක ශුද්ධ උපලබ්ධි අගය
බටර්	ඇස්ට්‍රා	1000	100	90
	හයිලන්ඩ්	800	140	150
කිරි	හයිලන්ඩ්	2000	40	30
	කොත්මලේ	1500	40	50

(14) මෙම සමාගම කාණ්ඩ ක්‍රමය අනුගමනය කරමින් සිට අයිතම ක්‍රමයට පරිවර්තනය වීම නිසා තොගයේ අගය වෙනස්වීමෙන් ලාභයේ හටගන්නා වෙනස වනුයේ,

1. ලාභය රු. 20,000 කින් අඩුවේ.
2. ලාභය රු. 23,000 කින් වැඩිවේ.
3. ලාභය රු. 23,000 කින් අඩුවේ.
4. ලාභය රු. 20,000 කින් වැඩිවේ.
5. ලාභය රු. 25,000 කින් අඩුවේ.

(.....)

(15) රත්න සමාගමේ 2026/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්විය යුතු තොගයේ අගය වන්නේ,

1. රු. 322,000 කි.
2. රු. 342,000 කි.
3. රු. 320,000 කි.
4. රු. 350,000 කි.
5. රු. 345,000 කි.

(.....)

(16) SLERS 15 ට අනුව (ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් ඇතිවන ආයභාරය) පහත ප්‍රකාශ ඔබට ලබා දී ඇත.

A- 'ව්‍යාපාරයක ප්‍රධාන මෙහෙයුම් කටයුතු තුළින් උපයන ආදායම අයභාරය වේ'

B- 'ව්‍යාපාරයක ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත තුළින් උපයන ආදායම ලාභය වේ'

C- ව්‍යාපාරයක ප්‍රධාන මෙහෙයුම් කටයුත්තට පරිබාහිරව ලබන ආදායම අයභාරය වේ'

D- ව්‍යාපාරයක ප්‍රධාන මෙහෙයුම් කටයුත්තට පරිබාහිරව ලබන ආදායම ලාභය වේ'

ඉහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ,

1. A හා D
2. A හා C
3. B හා C
4. B හා D
5. C හා D

(.....)

(17) SLERS 16 කල්බදු ප්‍රමිතියට අදාළව භාවිත අයිතිය ඇති වත්කම් ආරම්භයේදී මෙන්ම හඳුනා ගැනීමෙන් පසුවද මිනුම් කරනුයේ,

1. ප්‍රත්‍යාගණන අගයටය.
2. ශුද්ධ උපලබ්ධි අගයටය.
3. සුන්බුන් අගයටය.
4. ධාරණ අගයටය.
5. පිරිවැයටය.

(.....)

(18) සීමිත සමගි සමාගමේ තම නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයක යලි ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා ආර්ථික ඇණවුම් ප්‍රමාණය භාවිතා කරයි. ඒ සඳහා පහත තොරතුරු ඔබට දී ඇත.

- වාර්ෂික ඉල්ලුම් ඒකක 1,000,000
- ඒකක 2000 ක ඇණවුම් ප්‍රමාණයකදී මුළු වාර්ෂික ඇණවුම් පිරිවැය රු.6000
- ඒකකයක් වාර්ෂිකව රඳවා ගැනීමේ පිරිවැය රු.6 නම් සීමිත සමගි සමාගමේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EAQ) ඒකක

1. 3000 කි.
2. 4000 කි.
3. 2000 කි.
4. 1000 කි.
5. 5000 කි.

PAST PAPERS WIKI

(.....)

(19) A හා B හවුල් ව්‍යාපාරයට $\frac{1}{4}$ ක ලාභ කොටසකට C බඳවා ගත් අතර කීර්ති නාමය ලෙස ගෙන ආවටිනාකමේ ශුද්ධ අගය පමණක් A හා B ඔවුන්ගේ පැරණි ලාභාලාභ අනුපාතයට පිළිවෙලින් රු. 6000ක්

හා රු. 4000 බැගින් ඔවුන්ගේ ප්‍රාග්ධන ගිණුම්වලට බැරකර ගන්නා ලද නම් **C** ව්‍යාපාරයට පැමිණි විට තක්සේරු කළ කීර්ති නාමයේ මුළු අගය වන්නේ,

1. රු.30,000 කි.
2. රු.40,000 කි.
3. රු.50,000 කි.
4. රු.60,000 කි.
5. රු.10,000 කි.

(.....)

(20) සීමිත ප්‍රතිභා පොදු සමාගමේ සේවකයෙකු 2025/12/11 දින රු.600,000 ක වන්දි ඉල්ලා සමාගමට විරුද්ධව නඩු පවරා තිබූ අතර 2025/04/01 දිනට සමාගමේ සේවක වන්දි ප්‍රතිපාදනය රු.150,000 ක් විය. 2026/05/01 දින අධිකරණ නඩු තීන්දු ප්‍රකාරව සමාගම විසින් රු. 500,000 ක වන්දි මුදලක් ගෙවා ඇත. අධ්‍යක්ෂක මණ්ඩලය මගින් 2026/06/01 දින මූල්‍ය වාර්තා අනුමත කරනු ලබයි. **LKAS** 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතිය අනුව 2026/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල හඳුනාගත යුතු වගකීම් ප්‍රතිපාදන ප්‍රමාණය හා වසරට අදාළව හඳුනාගත යුතු සේවක වන්දි වියදම කොපමණද?

	2026/03/31 දිනට හඳුනාගත් වගකීම් (රු.000)	වසරට අදාළව හඳුනාගත් වියදම (රු.000)
1.	600	500
2.	500	150
3.	600	500
4.	500	650
5.	500	350

(.....)

(21) "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි සම්බන්ධ ප්‍රමිතියට **(LKAS 8)** අනුව පහත සඳහන් ඒවායින් ඇස්තමේන්තු වෙනස්වීම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත හැක්කේ මොනවාද?

A - පෙර වර්ෂයෙහි කපාහරින ලද රු.50,000ක ණයගැතියෙකුගේ ණය ප්‍රවර්ථන වර්ෂයේදී ලැබීම.

B - තොග අගය කිරීමේ FIFO (ප්‍රථම පැමිණි ප්‍රථම පිට) ක්‍රමය වෙනුවට ප්‍රවර්ථන වර්ෂයේ සිට WAC (බර තැබූ සාමාන්‍ය පිරිවැය) ක්‍රමය යොදා ගැනීම.

C - ප්‍රවර්තන වර්ෂයේ සිට දේපල පිරියත හා උපකරණ ක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට මාරු කිරීම.

D - ගොඩනැගිලි නවීකරණය හේතුවෙන් එහි ඵලදායි ජීවකාලය වසර 10 සිට වසර 12 දක්වා වැඩිවන බව තීරණය කිරීම.

ඉහත සඳහන් ඒවායින් ඇස්තමේන්තු වෙනස්වීම් ලෙස හඳුනා ගැනෙන්නේ,

1. A සහ C පමණි.
2. A සහ D පමණි.
3. A,B සහ C පමණි.
4. A,C සහ D පමණි.
5. B,C සහ D පමණි.

(.....)

(22) සීමිත උදය පොදු සමාගමේ 2026.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

	රු' 000	
	හර	බැර
ආදායම් බදු ගෙවීම - 2025/2026	300	

ආදායම් බදු සඳහා වෙන් කිරීම (2024/2025) 350

2024/2025 වර්ෂය සඳහා ආදායම් බද්ද රු. 325,000 ක් විය යුතු බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග එකඟ වී ඇත. 2026/03/31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් බද්ද රු.350,000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

ඉහත තොරතුරු ඇසුරෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කළ යුතු නිවැරදි අගයන් මොනවාද?

	ආදායම් බදු වියදම	**ආදායම් බදු වගකීම**
1.	325,000	50,000
2.	325,000	65,000
3.	325,000	90,000
4.	350,000	65,000
5.	350,000	90,000

(.....)

(23) **2025.04.01 දිනට සීමිත "සතුක" පොදු සමාගමේ නිකුත් කළ සාමාන්‍ය කොටස් ගණන 400,000 ක්ද ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 10,000,000 ද විය. 2025.10.01 දින එදිනට තිබූ සෑම සාමාන්‍ය කොටස් 4කට 1 බැගින් කොටසක් රු. 25 බැගින් සංචිත ප්‍රාග්ධනිත කිරීමත් සිදු කරන ලදී. තවද, 2026.03.01 දින එදිනට පැවති සෑම සාමාන්‍ය කොටස් 05කටම 1 බැගින් කොටසක මිල රු. 20 බැගින් වූ හිමිකම් නිකුතුවක් සිදු කරන ලදී. කොටස්කරුවන් විසින් සියලුම හිමිකම් ලබාගන්නා ලදී.**

මෙම ගනුදෙනු හේතුවෙන් 2026.03.31 මිලට සමාගමේ හිමිකමෙහි වැඩිවීම හෝ අඩුවීම කොපමණද?

1. රු 2,000,000 කින් වැඩිවේ.
2. රු 2,000,000 කින් අඩුවේ.
3. රු 2,500,000 කින් වැඩිවේ.
4. රු 4,500,000 කින් වැඩිවේ.
5. රු 4,500,000 කින් අඩුවේ.

(.....)

(24) පහත දැක්වෙන කුමන දෑ සමාගමක මුළු හිමිකම වෙනස්වීම සඳහා අදාළ නොවේද?

A කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම.

B උපචිත විගණන ගාස්තු සටහන් කිරීම.

C සංචිත ප්‍රාග්ධනිත කිරීම.

D හිමිකම් නිකුතුවක් සිදුකිරීම.

E සාමාන්‍ය කොටස් හිමියන්ට අවසාන ලාභාංශයක් යෝජනා කිරීම.

1. A හා B පමණි
2. A හා C පමණි
3. A හා E පමණි
4. B හා C පමණි
5. C හා E පමණි

(.....)

(25) සීමිත ලංකා සමාගමේ 2026/03/31 න් අවසන් වර්ෂයේ විකුණුම් රු. 9,000,000 ක් වූ අතර ඉන් 80% ක් ණයට විකුණුම්ය. සමාගමේ විකුණුම් මත දලලාභ අනුපාතය 30% කි. පහත අතිරේක තොරතුරු ඔබට දී ඇත.

කාලච්ඡේදය	වෙළඳ ලැබිය යුතු දෑ	තොගය
2026/03/31	1,000,000	500,000
2025/03/31	800,000	900,000

වර්ෂය තුළ වැඩකරන දින ගණන 360 ක් නම් තොග රැඳවුම් කාලය දින,

1. 30 කි. 2. 40 කි. 3. 50 කි. 4. 20 කි. 5. 10 කි.

(.....)

(26) x සමාගමේ අමුද්‍රව්‍යයකට අදාළ තොරතුරු පහත වේ.

	උපරිම	අවම
සතියක පරිභෝජන ඒකක	4000	1000
පොරොත්තු කාලය සති	6	4

x සමාගමේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඒකක 1500 ක් නම් උපරිම තොග මට්ටම වන්නේ ඒකක,

1. 20000 කි. 2. 20500 කි. 3. 22500 කි. 4. 23000 කි. 5. 21500 කි.

(.....)

(27) සීමිත ප්‍රිති සමාගමේ 2026/03/31 දිනෙන් අවසන් වර්ෂයේ පහත යන්ත්‍ර විකිණීම සිදු විය.

A) පිරිවැය රු. 780,000 ක යන්ත්‍රය විකුණුම් මිලෙන් 25% ක ලාභයක් සහිතව අත්පිට මුදලට විකිණීම.

B) සමාගම ගෙවූ පොලී හා ගෙවූ ලාභාංශ පිළිවෙලින් රු. 30,000 ක් හා රු. 40,000 කි.

C) ඉහත ගනුදෙනු නිසා සීමිත xy සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම්, ආයෝජන, මූල්‍ය ක්‍රියාකාරකම්වලට වන නිවැරදි සමස්ත ශුද්ධ බලපෑම වන්නේ,

( ) ලකුණ ශුද්ධ මුදල් අඩුවීමකි.

(රු. 000)

පිළිතුරු අංක	ක්‍රියාකාරකම		
	මෙහෙයුම්	ආයෝජන	මූල්‍ය
1.	290	780	40
2.	(190)	780	(40)
3.	(330)	(780)	-
4.	(290)	780	(40)
5.	(290)	520	(40)

(.....)

(28) සමච්ඡේදන ලක්ෂයේදී පහත කුමන ප්‍රකාශන නිවැරදි වේද?

A. මුළු දායකය මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.

B. මුළු විකුණුම් ආදායම මුළු ස්ථාවර පිරිවැයේ වටිනාකමට සමාන වේ.

C. මුළු ස්ථාවර පිරිවැය හා මුළු විචල්‍ය පිරිවැය එකතුව මුළු විකුණුම් ආදායමට සමාන වේ.

D. ඒකකයක ස්ථාවර පිරිවැය ඒකකයක විචල්‍ය පිරිවැයට සමාන වේ.

1. A හා B පමණි. 2. A හා C පමණි. 3. A,B හා D පමණි.
4. A,B හා C පමණි. 5. A,B,C,D යන සියල්ලම

(.....)

(29) නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන මට්ටම හා ඒකක පිරිවැය පහත දී ඇත.

නිෂ්පාදන මට්ටම (ඒකක)	ඒකකයක පිරිවැය (රු.)
500	100
600	90

පහත දැක්වෙන ඒවායින් කුමන් විචල්‍ය පිරිවැය හා මුළු ස්ථාවර පිරිවැය දක්වයිද?

1. රු. 40 සහ 30,000 2. රු. 10 සහ 50,000 3. රු. 40 සහ 54,000
4. රු. 10 සහ 24,000 5. රු. 20 සහ 54,000

(.....)

(30) අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී ව්‍යාප්තියක ශුද්ධ වර්තමාන අගය වැඩි වීමට පහත කුමන සාධක බලපායිද?

A. වට්ටම් සාධකය වැඩිවීම.

B. අවශේෂ අගය වැඩිවීම.

C. මූලික ආයෝජන මුදල අඩු වීම.

D. වාර්ෂික ශුද්ධ මුදල් ගලා ඒම අඩු වීම.

1. A හා D පමණි.
2. B හා C පමණි.
3. A,B හා D පමණි.
4. A,B හා C පමණි.
5. B,C හා D පමණි.

(.....)

- **ප්‍රශ්න අංක 31 -50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරිමත ලියන්න.**

(31) පහත දැක්වෙන ගිණුම්කරණ නිමැවුම් අයත්වන්නේ මූල්‍ය ගිණුම්කරණයටද කළමනාකරණ ගිණුම්කරණයටද යන්න දක්වන්න.

1. පොදු කාර්ය විභජන පත්‍රිකාව .....
2. අයවැය ලේඛණ .....
3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය .....
4. පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය .....

(32) ව්‍යාපාරයක් විසින් පිරිවැය රු. 300,000 ක් වූ තොගයක් 2025/10/01 දින විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවා ඇත. 2026/03/31 වන විට මෙම තොගයෙන් විකුණුම් බවට පත්ව ඇත්තේ 75% ක තොග පමණි. මේ පිළිබඳව කිසිදු සටහනක් තබා නොමැත.

පිරිවැය මත දල ලාභ අනුපාතිකය 10% කි.

මෙම ගනුදෙනුව නිසා 2026/03/31 න් අවසන් වසර තුල ගිණුම්කරණ මූලිකාංගවලට සිදු වී ඇති ශුද්ධ බලපෑම (අඩු වේ, වැඩි වේ, වෙනස් නොවේ යන්න දක්වන්න.)

1. ලාභය .....
2. වගකීම් .....
3. වියදම් .....
4. ආදායම් .....

(33) ව්‍යාපාරයක වර්ෂය තුල රු. 300,000 ක ලාභයක් පැවති අතර යෙදූ අමතර ප්‍රාග්ධනය ගැනිලි වලට වඩා රු.100,000 ක් වැඩිය. වර්ෂය ආරම්භයේ වත්කම් රු. 700,000 කි. වර්ෂය තුල වගකීම් රු.100,000 කින් අඩු වී ඇත. වර්ෂය අවසානයේදී ව්‍යාපාරයේ මුළු වත්කම් වල වටිනාකම කොපමණද?

.....

.....

(34) පහත එක් එක් අවස්ථාවල වඩාත් අදාල ගිණුම්කරණ සංකල්පය දක්වන්න.

<u>ගිණුම්කරණ සංකල්පය</u>

A- දේපල පිරියත උපකරණ මුල්වරට පිරිවැයට හඳුනාගැනීම .....

B- අයිතිකරුගේ නිවසේ විදුලිබිල ගෙවීම ව්‍යාපාරයේ වියදමක් ලෙස නොසැලකීම. .....

C- විකුණුම් අත්තිකාරම් ආදායමක් ලෙස හඳුනා නොගැනීම. .....

D- පිරිවැය හා ශුද්ධ උපලබ්ධි යන අගයෙන්, තොග අගය කිරීම සඳහා අඩු අගය යොදා ගැනීම. .....

(35) සමාගමක 2026 මාර්තු මාසය සඳහා තොග අයිතමයකට අදාලව පහත තොරතුරු සපයා ඇත.

දිනය	විස්තරය	ප්‍රමාණය (ඒකක)	ඒකක පිරිවැය (රු.)
2026/03/01	ශේෂය	300	20
2026/03/05	ගැණුම්	600	?
2026/03/20	විකුණුම්	600	?

සමාගම තොග නිකුත්කිරීම් මිල කිරීමට FIFO ක්‍රමය අනුගමනය කරයි. ඒ අනුව 2026/03/31 දිනට තොගයේ පිරිවැය රු. 7500කි.

1. 2026/03/05 මිලදී ගැනීමෙහි ඒකක පිරිවැය කීයද? .....

2. සමාගම WAC ක්‍රමය (භරිත සාමාන්‍ය ක්‍රමය) යොදාගන්නේ නම් 2026/03/31 දිනට තොග පිරිවැය කීයද?

.....

(36) සීමිත ගයාන් සමාගමේ 2026/03/31 න් අවසන් වසර තුල ගිණුම් තැබීමේදී නව ගිණුම් ලිපිකරු විසින් පහත වැරදි සිදු කර ඇත.

- 2025/10/01 දින මිලට ගත් දේපල පිරියත උපකරණ රු.250,000 ක් තොග ලෙස හඳුනාගෙන ඇත. දේ.පි.උ වාර්ෂිකව 10% කින් ක්ෂය කරයි.
- වසරේ කපාහල වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභය රු.10,000 ක් නැවත ලැබීම් වෙලඳ ලැබිය යුතු දෑ ගිණුමට බැර කර මුදල් හරකර ඇත.
- වෙලඳ ලැබිය යුතු දෑගෙන් ලැබූ මුදල් රු. 20,000 ක් වෙලඳ ගෙවිය යුතු දෑට ගෙවූ මුදල් ලෙස සටහන් කර ඇත.

ඉහත වැරදි නිසා 2026/ 03/31 න් අවසන් වසරේ ලාභයට සිදු වී ඇති බලපෑම දක්වන්න.

.....

.....

(37) ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

		රු
සුළු මුදල් පොතේ ශේෂ	- 2026.01.01	600
	- 2026.01.31	400
ප්‍රතිපූරණය කිරීම	- 2026.01.01	1900

සුළු මුදල් අග්‍රිමය රු. 500කින් වැඩි කරමින් 2026.02.01 දින ප්‍රතිපූරණය කළ මුදල කොපමණද?

.....

(38) 2026.03.31 දිනට ව්‍යාපාරයක බැංකු ප්‍රකාශය අනුව බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 630,000කි. නමුත් එය එදිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සමග අසමාන විය. මෙම වෙනසට හේතු වූයේ පහත දෑය.

i. ස්ථාවර නියෝග මත ණය වාරික ගෙවීම රු. 10,000කි.

ii. තැන්පත් කළ නමුත් උපලබ්ධි වී නොමැති චෙක්පත්වල වටිනාකම රු. 40,000කි.

1. 2026.03.31 දිනට නිවැරදි කිරීමට පෙර ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය කොපමණද?

.....

2. 2026.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වනු ලබන බැංකු ශේෂය කොපමණද?

.....

(39) පහත වැරදි මගින් ව්‍යාපාරයක ශේෂ පිරික්සුමේ වෙනසක් "ඇති වේද", "ඇති නොවේද" යන්න දක්වන්න.

1. රු. 40,000 ක විකුණුම් ඉන්වොයිසියක් පොත්වලින් මගහැරීම .....
2. රු 15,000 ක බැංකු අයිරාව වාසිදායක ශේෂයක් ලෙස ශේෂ පිරික්සුමට උපුටා ගැනීම. .....
3. රු. 4,000 ක දුන් වට්ටම් ලද වට්ටම් ගිණුමට හර කිරීම .....
4. රු. 30,000 ක බොල්ණය කපා හැරීම පාලන ගිණුමේ සටහන් කල ද අදාළ ණයගැති ගිණුමේ සටහන් නොවීම. .....

(40) සීමිත *x* සමාගමේ 2025/12/31 දිනට පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

- වර්ෂය තුළ සේවකයින්ට ගෙවූ ශුද්ධ වැටුප රු. 180,000
- ශුද්ධ වැටුපින් අඩුකරන එකම අඩු කිරීම වන්නේ 10% ක සේවක අර්ථසාධකය පමණි.
- කාලච්ඡේදයේ ජීවන වියදම් දීමනාව රු. 30,000 මූලික වැටුපට එකතු කර ඇත.
- සේවක අර්ථසාධක දායකය සේවක මූලික වැටුපින් 10% ක්ද සමාගම 15% ක් ද වශයෙන් දායක වේ නම්,

1. 2025/12/31 දිනෙන් අවසන් වර්ෂයට සමාගමේ සේවක මුළු වියදම කොපමණද?

.....

2. 2025/12/31 දිනට සමාගම සේවක අර්ථසාධක අරමුදලට මෙතෙක් දායක මුදල් කිසිවක් යවා නැත්නම් යැවිය යුතු මුළු දායක මුදල කොපමණද?

.....

(41) *x* සමාගමේ ණයගැතියෙකු විසින් ශේෂය පියවීමට සමාගමට මුදල් ගෙව්වේ නම් පහත අනුපාතයන් අඩුවේද? වෙනස් නොවේද? යන්න දක්වන්න.

1. ජංගම අනුපාතය .....
2. ක්ෂණික අනුපාතය .....

(42) සීමිත නාලක පොදු සමාගමේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

- කාලච්ඡේදය 2025/12/31 න් අවසන් වේ.
- මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂවරු අනුමත කරන දිනය 2026/02/15

- සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන දිනය 2026/02/28

2025/12/31 න් පසු පහත සිද්ධීන් සමාගමේ සිදුවිය.

A- 2025/12/31 දිනට රු. 200,000 ක වගකීමක් ඇතිබව තහවුරු කරමින් 2025/02/25 දින නඩු තීන්දුවක් ලබාදෙන ලදී.

B- 2026/02/15 දින සාමාන්‍ය කොටසකට රු. 5 බැගින් වූ අවසාන ලාභාංශයක් ප්‍රකාශයට පත්කරන ලදී.

C- 2026/02/20 දින ව්‍යාපාරයේ ගින්නක් ඇති වූ අතර ඉන් ඇති වූ අලාභය රු.ලක්ෂ 90 ක් බව ගණන් බලා ඇත.

D- 2025/12/31 දිනට රු. 100,000 ක් ගෙවිය යුතු ණයගැතියෙකු 2026/01/20 දින බුන්වත් බව ප්‍රකාශ කරන ලදී.

LKAS 10 අනුව (වාර්තාකරන කාලච්ඡේදයට පසු සිදුවීම්)ප්‍රමිතියට අනුව 2025/12/31 දිනෙන් අවසන් වර්ෂයට සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපිය යුතු සිද්ධි හා නොගළපා හෙළිදරව් කළ යුතු සිද්ධි දක්වන්න.

.....

.....

.....

(43) LKAS 37 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතියට අනුව පහත අයිතම සමාගමක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රතිපාදන ලෙස හඳුනා ගන්නා හා හඳුනා නොගන්නා දෑ ලෙස වෙන්කරන්න.

A- ක්ෂය සඳහා වෙන්කිරීම්

B- සේවක වන්දි ඉල්ලීම් සඳහා වෙන්කිරීම්

C- අඩමාණ ණය සඳහා වෙන්කිරීම්

D- වගකීම් සහතික මත ඉඩ හැරීම සඳහා වෙන් කිරීම

.....

.....

(44) ව්‍යාපාරයක විකුණුම් පිරිවැය රු. 520,000 ක් විය. ආරම්භක තොගයට වඩා අවසාන තොගය රු. 20,000කින් වැඩි වූ අතර රු. 10,000ක තොගයක් වර්ෂය තුල සම්පූර්ණයෙන්ම විනාශ විය. වර්ෂය ආරම්භයට වඩා අවසානයේ ණයහිමි ශේෂය රු.40,000 කින් අඩු වූ අතර ණයහිමියන්ගෙන් වර්ෂය තුල ලද වට්ටම් රු. 2000ක් වූයේ නම් ණයහිමියන්ට වර්ෂය තුල කල ගෙවීම් ගණනය කරන්න.

.....

.....

.....

- **45 සහ 46 ප්‍රශ්නවලට පිලිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

සතියකට දින 5ක් වැඩ කරන නිෂ්පාදන ව්‍යාපාරයක සාමාන්‍යයෙන් සතියකට ද්‍රව්‍ය 2500Kg ක් අවශ්‍ය වන අතර උපරිම අවශ්‍ය වන්නේ 4000kg කි. පොරොත්තු කාලය දින 20-30 අතර පවතී. ආයතනය සති 4ක සාමාන්‍ය පරිභෝජනයට අවශ්‍ය තොග ප්‍රමාණය එකවර ගෙන එනු ලැබේ. මෙම ආයතනය EOQ ආකෘතිය භාවිතා නොකරයි.

(45) 1. යලි ඇණවුම් මට්ටම කොපමණද? .....

2. යලි ඇණවුම් ප්‍රමාණය කොපමණද? .....

(46) 1. උපරිම තොග මට්ටම ගණනය කරන්න. .....

2. අවම තොග මට්ටම ගණනය කරන්න. .....

(47) සීමිත මිනුක සමාගමේ 2026/03/31 දිනෙන් අවසන් වසරේ බදු වියදම හා සම්බන්ධ පහත තොරතුරු ඔබට සපයයි.

		රු.
ගෙවූ බදු -	2024/2025 සඳහා	25,000
	2025/2026 සඳහා	75,000

2025/04/01 දිනට බදු වෙන්කිරීම - රු. 30,000

2026/03/31 දිනෙන් අවසන් වසර සඳහා ලා/ලා සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ බදු ලෙස හඳුනා ගන්නා වටිනාකම සොයන්න.

.....

.....

- **ප්‍රශ්න අංක 48 හා 49 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොටතුරු භාවිතා කරන්න.**

සුපුන් සහ නිපුන් 3:2 අනුපාතයට ලාභා ලාභ බෙදා ගනිමින් පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2026/03/31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ ව පහත තොරතුරු සපයා ඇත.

- වාර්ෂිකව රු. 100,000 හා 60,000 ක වේතනයක් පිළිවෙළින් සුපුන්ට හා නිපුන්ට හිමි වී ඇත.
- සුපුන්ට හා නිපුන්ට පිළිවෙළින් රු. 60,000 ක හා රු. 40,000 ක අවසාන ලාභ කොටස් බෙදා තිබේ.
- 2026.03.25 දින ඉතිරි ගිණුම් වර්ෂයේ විකුණුම් සඳහා චෙක් පතකින් ලද අත්තිකාරම් මුදල් රු. 100,000 නිපුන් තම පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගොස් ඇත. මෙම ගනුදෙනුව සම්බන්ධව කිසිදු සටහනක් යොදා නැත.
- සුපුන් විසින් 2025.04.01 දින ව්‍යාපාරයට රු. 400,000 ක ණය මුදලක් සපයා තිබූ අතර, ඒ සඳහා ගෙවිය යුතු 10% ක වාර්ෂික පොලිය සම්බන්ධයෙන් වාර්තා කර නොමැත.

(48) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ හවුල් ව්‍යාපාරය උපයා ඇති ශුද්ධ ලාභයේ නිවැරදි වටිනාකම

.....

(49) ආරම්භක ශේෂයන් නොමැති බවට උපකල්පනය කරමින් 2026.03.31 දිනට සුපුන් නිපුන්ගේ ජංගම ගිණුම් ශේෂයන් වන්නේ,

සුපුන් රු .....

නිපුන් රු .....

(50) කසුන්ගේ ව්‍යාපාරයේ අලෙවිකරණ භාණ්ඩයකට අදාල පිරිවැය සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත ලබා දී ඇත.

- ඒකක විචල්‍ය පිරිවැය රු. 210
- සමච්ඡේද විකුණුම් ප්‍රමාණය (ඒකක) 100
- දායක විකුණුම් අනුපාතය 30%

මෙම භාණ්ඩයෙන් ඒකක 500ක් අලෙවි කිරීමට අපේක්ෂා කරයි නම්,

1. අපේක්ෂිත ලාභය .....

ආරක්ෂිත ආන්තිකයේ වටිනාකම .....

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - **2026**
தென வார பரீக்ஷணය

විෂයය නම (ගිණුම්කරණය) පාடத்தின் பெயர் (கணக்கியல்) Subject Name (Accounting)	33	S	II	**13** ශ්‍රේණිය 13-ஆம் வகுப்பு **Grade 13**

පැය තුනයි
மூன்று மணிநேரம்.
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු **10** යි
கூடுதல் வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்.
Additional Reading Time – 10 minutes

උපදෙස් :

- **පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුලු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.**
- **අදාල පෙරවැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණනන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200 ක් හිමිවේ.**

(01) සීමිත නිර්මල පොදු සමාගම 2026.03.31 වන දිනෙන් අවසන් වන ගිණුම් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම පහත දැක්වේ.

විස්තරය	(රු.000	රු.000
ඉඩම් හා ගොඩනැගිලි	31 500	
මෝටර් රථ කල්බදු	9 000	
කාර්යාල උපකරණ	4 500	
වෙළඳ තොගය (25/04/01)	3 000	
ගැණුම්	24 150	
විකුණුම්		60 375
20% ආයෝජන	30 000	
වෙළඳ ලැබිය යුතු දෑ	4 500	
පරිපාලන වියදම්	11 700	
බෙදාහැරීමේ වියදම්	13 950	
ගෙවූ ආදායම් බදු	1 770	
කල්බදු වාරික ගිණුම	2 925	
මුදල් හා මුදල් සමාන දෑ	930	
ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස්		30 000
ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතය		3 000
රදවාගත් ඉපයීම් (25/04/01)		11 400
පොදු සංචිතය		3 000
කල්බදු ණයහිමි		7 155
වෙළඳ ගෙවිය යුතු දෑ		8 595
ආදායම් බදු ප්‍රතිපාදනය (25/04/01)		600
22% බැංකු ණය		6 000
සමුච්චිත ක්ෂය (25/04/01)		7 800
	137 925	137 925

අතිරේක තොරතුරු

1) 2026.03.31 වන දිනට අවසන් තොගයේ පිරිවැය රු.3 150 000 වන අතර එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 3 000 000 වේ. මෙම තොගය 2026.04.03 දින රු.2 925 000 විකුණන ලදී.
2) 2026.04.10 වන දින ගබඩාවේ තිබූ රු.450 000 ක තොගයක් සම්පූර්ණයෙන්ම විනාශ විය.
3) සමාගම එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි සමාගමක් වන අතර සමාගම ගැණුම් හා විකුණුම් මත 15% ක VAT ඇතුළත් වේ.
4)

විස්තරය	පිරිවැය/ප්‍රත්‍යාගණන අගය	සම්මුචිත ක්ෂය
ඉඩම්	13 500	-
ගොඩනැගිලි	18 000	5100
මෝටර් රථ කල්බදු	9 000	1 800
කාර්යාල උපකරණ	4 500	900
	45 000	7 800

- 2026.01.01 වන දින ඉඩම රු.11250 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.
- 2026.03.31 වන දින ගොඩනැගිල්ල ප්‍රථම වරට රු.11 400 000 කට ප්‍රත්‍යාගණනය කර ඇත.
- ගොඩනැගිල්ල හා කාර්යාල උපකරණ පිළිවෙළින් පිරිවැය මත 5% හා 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කල යුතුය.

5) 2024/04/01 වන දින සමාගම කල්බදු ගිවිසුමට එළඹෙන අතර වසර 4 කාලයක් සඳහා මෝටර් රථයේ භාවිත අයිතිය ලබා ගන්නා ලදී.වාර්ෂික කල්බදු වාරික ගිණුමට හරකර ඇත.ඵලදායී ජීවිත කාලය වසර 5 කි.කල්බදු කාලය අවසානයේ වත්කමේ අයිතිය සමාගම වෙත පැවරේ.වාර්ෂික කලබදු පොලිය පහත පරිදි වේ.

2024/2025	2025/2026	2026/2027	2027/2028
1080	810	540	270

6) සමාගම 2025/10/01 වන දින රු.30 000 000 ක් ආයෝජනය කර ඇත.
7) ප්‍රවර්තන වර්ෂයේ ගෙවූ පරිපාලන වියදම් තුළ පහත වියදම් ඇතුළත් වේ.

ගෙවූ වැටුප්	2 700 000
විගණන ගාස්තු	3 000 000
ගොඩනැගිලි කුලී	5 400 000
අධ්‍යක්ෂක ගාස්තු	600 000

- වර්ෂයේ විගණන ගාස්තු 2 700 000
- සේවක වැටුප් ගෙවා ඇත්තේ 10% ක අර්ධසාධක අරමුදල් අඩු කිරීමෙන් පසුවය.අර්ධසාධක අරමුදලට සේවා දායකය 15% කි.එය ප්‍රවර්ථන වර්ෂය සඳහා ගෙවා නොමැත.සේවා නියුක්තියගන්ගේ භාරකාර අරමුදල 3% ද ව්‍යාපාරය ගෙවා නැත.
- 2026/03/31 වන විට අධ්‍යක්ෂ ගාස්තු රු.450 000 උපචිතව පැවතුනි.
- 2025/10/01 වන දින කුලියට ගත් ගොඩනැගිල්ලේ මාසික කුලිය රු.450 000 කි.

8) බැංකු ණය 2025/04/01 වන දින ලබා ගෙන ඇති අතර එය රු.1200 000 බැගින් වාරික 5 කින් පොළිය සමඟ ගෙවිය යුතුය.එහි පළමු වාරිකය රු.1 200 000 හා පොලිය 2026/03/31 දින මුදලන් ගෙවා බෙදාහැරීමේ වියදම් තුළ ඇතුළත්කර තිබුණි.
9) ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් බද්ද රු.2 250 000 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර පෙර වර්ෂය සඳහා ගෙවූ රු.570 000 බද්ද ගෙවූ ආදායම් බදු තුළ ඇතුළත්ය.
10) කොටස් හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ රු.600 000 ක් බෙදා හැරීමේ වියදම් තුළ ඇතුළත්ය.
11) ගෙවූ බෙදාහැරීමේ වියදම් තුළ ඇතුළත් ප්‍රචාරන වියදම් වලින් රු.450 000 2027/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහාය
12) වර්ෂය තුළ රඳවා ගත් ඉපැයීම් භාවිත කර රු.3 000 000 ක ප්‍රසාද කොටස් නිකුතුවක් සිදුකර ඇත.2026/05/25 දින අධ්‍යක්ෂවරු මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලදී.

අවශ්‍ය වන්නේ, ප්‍රසිද්ධ කිරීම සඳහා

(1)2026/03/31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ වෙනත් විස්තිරණ ආදායම් ප්‍රකාශය

(2) 2026/03/31වන දින අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

(3) 2026/03/31වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(4) ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් (ලකුණු 40)

(02)(අ) නිෂ්පාදන ව්‍යාපාරයක M_1 නැමැති අමුද්‍රව්‍ය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

2026/05/01 ගැණුම් ඒකක 18 000 (ඒකකයක් රු.20)

2026/05/05 කම්හලට නිකුත් කිරීම ඒකක 10 000

2026/05/15කම්හලට සිදුකළ ආපසු එවුම් ඒකක 2 000

2026/05/20 ගැණුම් එකක 18 000 (ඒකකයක් රු.24)

2026/05/25 05/20 මිලදී ගත් තොගයෙන් සැපයුම් කරුවන්ට ආපසු යැවුම් ඒකක 2000

අමතර තොරතුරු,

(01) 2026/05/01වන දිනට කම්හල් ඒකක 2 000 ක් පැවැති අතර එහි වටිනාකම රු.32 000

(02) 2026/05/31 වන දිනට කම්හලේ ඉතිරි තොගය ඒකක 1000

(03) දිනක උපරිම පාරිභෝජනය ඒකක 600 ක් වන අතර උපරිම පොරොත්තු කාලය දින 10 කි.

(04) ආයතනය තොග අගය කිරීම සඳහා හරිත සාමාන්‍ය මිල ක්‍රමය අනුගමනය කරයි.

අවශ්‍ය වන්නේ,

(1)යලි ඇණවුම් ප්‍රමාණය

(2)යලි ඇණවුම් මට්ටම

(3)කම්හලේ දිනක සාමාන්‍ය පාරිභෝජනය

(4)2025.05.31 වන දිනට තොගයේ වටිනාකම (ලකුණු 16)

(ආ)සියැන්රෝ පොදු සමාගම කාන්තා පිරිමි සහ ළමා හිස්වැසුම් නිෂ්පාදනයේ නිරත වේ.මේ සඳහා නිෂ්පාදන දේපාර්තමේන්තු තුනක්ද ගබඩාව හා නඩත්තු වශයෙන් සේවා දේපාර්තමේනතු දෙකක් ද නඩත්තු කරයි.

(1)	නිෂ්පාදන දෙපාර්තමේන්තු			සේවා	
	පිරිමි	ගැහැණු	ළමා	ගබඩා	නඩත්තු
ප්‍රාථමික පිරිවැය	1 000 000	900 000	600 000	-	-
පොදු කාර්ය පිරිවැය	350 000	250 000	200 000	40 000	50 000
ද්‍රව්‍ය අධියාචනා පත්‍ර ගණන	5	3	2		
යන්ත්‍ර නඩත්තු වාර ගණන	8	6	4	2	
අයවැයගත යන්ත්‍ර පැය	10 000	6 000	4 000		
අයවැයගත නිමවුම් ඒකක	6 666	6 000	4 000		
සත්‍ය නිමවුම් ඒකක	6 600	6 100	5 000		
ඒකකයට අදාල යන්ත්‍ර පැය	1.5	1	0.75		

(2)සෑම දේපාර්තමේන්තුවකම යන්ත්‍ර පැය පදනමට පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරයි.

අවශ්‍ය වන්නේ,

(1)ද්විතික විභජනය සිදු කරමින් ඒ ඒ දෙපාර්තමේනතුවලට අදාල පොදු කාර්ය පිරිවැය

(2)ඒ ඒ දෙපාර්තමේන්තුවල පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය

(3)එක් එක් හිස්වැසුම් වර්ගවල මුළු පිරිවැය

(4)එක් එක් හිස්වැසුම් වර්ගයක ඒකක පිරිවැය (ලකුණු 24)

